සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## ඉතිහාසය - I

නම/විභාග අංකය :- .............................................................. කාලය: පැය 01 යි.

සැලකිය යුතුයි.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ඉතිහාසය හැදෑරීමේ දී තොරතුරු ලබාගත හැකි ප්‍රධානතම මූලාශ්‍ර දෙක ලෙස පිළිගනු ලබන්නේ,

(1) දේශපාලන මූලාශ්‍ර හා සාහිත්‍ය මූලාශ්‍ර
(2) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හා සාහිත්‍ය මූලාශ්‍ර
(3) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර
(4) දේශීය සාහිත්‍ය මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර

(02) පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වන රූප සටහනක් නොවන්නේ,

(1) ගුරු හඳ රූප (2) වටාපොත (3) මුරගල (4) කොත්කුරය

(03) මෙරටින් හමුවන පැරණිතම කාසි හඳුන්වා ඇත්තේ,

(1) කහාපණ (2) තඹ මස්ස (3) ධරණ (4) ලක්ෂ්මී කාසි

(04) පහත දැක්වෙන X හා Y තීරු නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර තෝරන්න.

| | X | | Y |
|---|---|---|---|
| (1) | මණිකාරගාම | A. | ගොවියන් විසූ ගම් |
| (2) | වඩ්ඪකිගාම | B. | ධීවරයන් විසූ ගම් |
| (3) | තසිකාරගාම | C. | මැණික් කර්මාන්තයේ යෙදුණු අය විසූ ගම් |
| (4) | ගෝපාලගාම | D. | වඩුවන් විසූ ගම් |
| | | E. | ගොපල්ලන් විසූ ගම් |

(1) CDAE (2) DCAE (3) BDAE (4) ABCD

(05) ගල් යුගයේ අභිචාර විධි අනුවින් ගව සැකිලි තමා වස්තු හර වළලා තිබූ ස්ථානය වන්නේ.

(1) රාවණා ඇල්ල ගල් ගුහාව
(2) පාහියන්ගල ගල්ගුහාව
(3) අත්තනගොඩ අලු ලෙන
(4) කුරුවිට බටදොඹ ලෙන

(06) ශුමනගේ පවුලට අයත් ලෝන වැව සිය රැකියාව ලෙස කළ ගහපතියෙකු භික්ෂුන්වහන්සේලාට ගල්ගුහාවක් පූජා කළ බව සඳහන් සෙල්ලිපිය වූයේ.

(1) කළුදියපොකුණ
(2) පෙරියපුලියන්කුලම
(3) තොප්ගල්සන්ද
(4) දුනුම්මලාහන්ද

(07) ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා වූයේ.

(1) මහා පරාක්‍රමබාහු රජු
(2) දේවානම්පියතිස්ස රජු
(3) වසභ රජු
(4) මහාවිජය රජු

(08) මෙරට දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු රාජ්‍ය පරිපාලනය හා සම්බන්ධ නිලධාරීන් X තීරුවේ ද අතීතයේ ඔවුන් හැඳින්වූ නම් Y තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර තෝරන්න.

| | X | | Y |
|---|---|---|---|
| (1) | අශ්ව සංඝයේ ප්‍රධානී | A. | සෙනෙවි |
| (2) | ඇමතිවරු | B. | රට අදෙන |
| (3) | කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානී | C. | වතගු |
| (4) | සේනාපති | D. | අස අදෙන |
| | | E. | අමැති |

(1) BECA (2) DEBA (3) DECA (4) DCBA

(09) ප්‍රාදේශීය පාලන බලය පරම්පරාවන්ට හිමිව තිබූ බව සඳහන් සෙල්ලිපිය දක්නට ලැබෙන ප්‍රදේශය වනුයේ,
(1) කන්තලම ප්‍රදේශය (2) සිතුල්පව්ව ප්‍රදේශය
(3) ඇතුල්දෙණි ප්‍රදේශය (4) මුලතිව් ප්‍රදේශය

(10) අතීතයේ රෝහල් ඉදිකරවීමෙන් වෛද්‍යවරයෙකු ලෙසත් ප්‍රසිද්ධියක් ඉපිදූ රාජ්‍ය පාලකයා වූයේ,
(1) හතරවන කාශ්‍යප රජු (2) බුද්ධදාස රජු
(3) පළමුවන උපතිස්ස රජු (4) පස්වන මිහිඳු රජු

(11) ත්‍රිකුණාමලයේ පිහිටි පැරණි ගෝකණ්ණතිත්ථ වරායට සමීපව ඉදිකර තිබූ හින්දු කෝවිල වන්නේ,
(1) මුන්නේශ්වරම් කෝවිල (2) නල්ලූර් කෝවිල
(3) තිරුකේතීශ්වරම් කෝවිල (4) කෝනේශ්වරම් කෝවිල

(12) පහත දැක්වෙන X හා Y තීරු නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර තෝරන්න.

| | X | | Y |
|---|---|---|---|
| (1) | මහසෙන් රජු | A. | බසවක්කුලම් වැව |
| (2) | දේවානම්පියතිස්ස රජු | B. | කලාවැව |
| (3) | පණ්ඩුකාභය රජු | C. | ගිරිතලේ වැව |
| (4) | ධාතුසේන රජු | D. | මින්නේරිය වැව |
| | | E. | තිසා වැව |

(1) DEBA (2) DCAB (3) DEAB (4) CEAB

(13) සංඝමිත්තා මෙහෙණින් වහන්සේ විසින් ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන මෙරටට පැමිණි වරාය වන්නේ,
(1) දඹකොළපටුන (2) ලංකාපටුන (3) ගොඩවාය (4) මහාතිත්ථ

(14) මහා විජයබාහු රජතුමාගේ සේවාවන් අතරින් විශේෂ ප්‍රමුඛතාව දිය යුතු පිළිතුර වන්නේ,
(1) අසල්වැසි රාජ්‍ය සමඟ විවාහ සබඳතා පැවැත්වීම
(2) වෙහෙර විහාර, වැව් අමුණු ප්‍රතිසංස්කරණය කරවීම
(3) චෝලීන් පරදවා පොළොන්නරුව නම් රාජධානිය කර ගැනීම
(4) ශ්‍රී පාදස්ථානයට ගමන් පුරා කිරීම

- පහත සඳහන් කරුණු අධ්‍යයනය කර 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දිනය B - ගුන්ජා C - අමුණු D - වර්ෂය E - ස්වර්ණ

(15) කාලය මැනීම හා සම්බන්ධ පිළිතුර වන්නේ,
(1) B හා C (2) A හා D (3) A හා E (4) D හා C

(16) වර මැකීම හා සම්බන්ධ පිළිතුර වන්නේ.

(1) E හා C (2) B හා D (3) B හා C (4) B හා E

(17) අතීතයේ වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අය කළ බදු වර්ගය වූයේ,

(1) මාලිග මත්ස්‍ය භාගය (2) දකපති
(3) මහරමටිවක (4) බොජකපති

(18) මහා විජයබාහු රාජ්‍ය සමයේ පොළොන්නරුවේ දළදා මාලිගයේ ආරක්ෂාව භාරව සිටියේ,

(1) වේලෛක්කාර හමුදාව (2) ත්‍රිවිධ හමුදාව
(3) පාබල හමුදාව (4) ලක්සිරිපද්ඤ හමුදාව

(19) පූජ ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් "මධුපාවිකා" යන විශේෂ ගෞරව නාමයෙන් හැඳින්වූ බව සඳහන් පැරණි සාහිත්‍ය ග්‍රන්ථය වන්නේ.

(1) සද්ධර්මාලංකාරය (2) ධම්පියා අටුවා ගැටපදය
(3) රසවාහිනිය (4) සාරසංග්‍රහය

(20) ළමරට ගොවිතැන පිළිබඳ තොරතුරු රැසක් ලියා ඇති තෝණිගල සෙල්ලිපිය මින් කිනම් රාජ්‍ය සමයක දී ලියවී තිබේ ද?

(1) දෙවන අග්බෝ රජු (2) වළගම්බා රජු
(3) කිත්සිරි ශ්‍රී මේඝවර්ණාභය රජු (4) දෙවන මුගලන් රජු

(21) සමාජ ධූරාවලියේ පුරවැසියන්ගේ මට්ටමට පහළින් සිටි සාමාන්‍ය ජනතාව සෙල්ලිපිවල සඳහන්ව ඇත්තේ,

(1) අන්තේවාසික (2) දාසයෝ (3) භාගපතිරු (4) කුඩීන්

(22) පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට තුඩුදුන් ආසන්නතම හේතුවක් වූයේ,

(1) දුර්වල පාලකයන් බලයට පත්වීම (2) කාලිංග මාඝගේ ආක්‍රමණය
(3) ආර්ථික පරිහානිය (4) කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය

(23) පහත දැක්වෙන X හා Y තීරු නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර තෝරන්න.

| | X | | Y |
|---|---|---|---|
| (1) | කිරිමෙර | A. | කුළුබඩු |
| (2) | කොහිල | B. | කිරි දෙනුන් |
| (3) | කළුන භාජ්ජ | C. | කැඳ |
| (4) | ගාලු | D. | අල වර්ග |

(1) BCAC (2) ABCD (3) BADC (4) BDCA

(24) ස්වාභාවික සුළං බලයෙන් ක්‍රියාත්මක වූ බවට අනාවරණය වී ඇති පැරණි යකඩ නිස්සාරණ උදුන හමු වී ඇත්තේ,

(1) සීගිරිය පොතාන (2) දැදිගම පැළකන්ද
(3) බලංගොඩ සමනළ වැව (4) අලිගල

(25) දැදිගම ඇත් පහන හමු වී ඇත්තේ මින් කවර ස්ථානයක සිදු කරන ලද කැණීම් වලින් ද?

(1) අභයගිරි දාගැබ (2) දැදිගම සූතිඝර චෛත්‍යය
(3) දෙමළ මහා සෑය (4) ලාහුගල නීලගිරි දාගැබ

(26) දන්ත ධාතූන් වහන්සේ වැඩමවා බෙලිගල දළදා මැඳුරේ තැන්පත් කර වූ රජතුමා වන්නේ.

(1) පළමුවන විමලධර්මසූරිය රජු (2) මහා විජයබාහු රජු
(3) වලගම්බා රජු (4) තුන්වන විජයබාහු රජු

(27) ගම්පොළ රාජ්‍ය සමයේ දී නිශ්ශංක අලකේශ්වර අමාත්‍යවරයා විසින් ශක්තිමත් බලකොටුවක් ඉදි කරවන ලද්දේ,

(1) ගම්පොළ (2) කෝට්ටේ (3) යාපහුව (4) කුරුණෑගල

(28) වර්ෂ 1505 දී පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට කෝට්ටේ රාජ්‍ය පාලකයා වූයේ,

(1) හයවන පරාක්‍රමබාහු රජු (2) ජයබාහු රජු

(3) නවවන පරාක්‍රමබාහු රජු (4) අටවන වීර පරාක්‍රමබාහු රජු

(29) යාපහුව රාජධානියේ දක්නට ලැබෙන පියගැටපෙළ හා එහි කුලුණු නිර්මාණය සඳහා ආභාසය ලැබී ඇත්තේ,

(1) පාණ්ඩ්‍ය හා කාම්බෝජ (2) පාණ්ඩ්‍ය හා චෝල

(3) කාම්බෝජ හා චීන (4) බුරුම හා කාම්බෝජ

(30) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් කාලවකවානු සහිතව අනුපිළිවෙල අනුව පෙළ ගැස්වූ විට නිවැරදි පිළිතුර වන්නේ.

A - මහා විජයබාහු රජු කාලිංග කුමරියක වූ තිලෝකසුන්දරී විවාහ කර ගැනීම

B - දෙවන රාජසිංහ රජතුමා පෘතුගීසීන් පලවා හැරීම

C - සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම

D - සපුමල් කුමරු යාපා පටුන ජය ගැනීම

E - වලගම්බා රජතුමා අභයගිරිය දාගැබ ඉදි කරවීම

(1) E C D B A (2) A B C D E (3) C E A D B (4) C A D E B

(31) චීනයේ චෙන් - හෝ නෞසෙනවියා විශාල හමුදාවක් සමග පැමිණ සටන් කර වීර අලකේශ්වර ඇතුළු පිරිසක් සිරකරුවන් ලෙස රැගෙන ගොස් ඇත්තේ මින් කුමන රාජධානි සමයේ ද?

(1) කුරුණෑගල (2) ගම්පොළ (3) යාපහුව (4) දඹදෙණිය

(32) යාපනය රාජධානියේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ.

(1) විජය කුලංකෙත (2) චක්කිරම (3) කුලසේකර (4) වරෝදය

(33) උඩරට නව රාජවංශයක ආරම්භකයා වූ පළමුවන විමලධර්මසූරිය රජතුමා මුහුණ දුන් අභියෝගයක් නොවූයේ.

(1) සීතාවක රාජ්‍ය උරුමයක් නොවීම

(2) උඩරට රාජ්‍ය සීතාවක බලපෑමෙන් මුදවාගත යුතුවීම

(3) පරිහානියට පත් බුදු සසුන නගා සිටුවිය යුතුවීම

(4) උඩරට රාජධානිය ඉංග්‍රීසි ග්‍රහණයෙන් බේරාගත යුතුවීම

(34) පහත දැක්වෙන X හා Y තීරු නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර තෝරන්න.

| X | | Y | |
|---|---|---|---|
| (1) | මඩිගෙ බද්ද | A. | වළං තැනීම |
| (2) | කුරුවේ බද්ද | B. | රෙදි සේදීම |
| (3) | බඩහැල බද්ද | C. | රෙදි වියීම |
| (4) | හැද බද්ද | D. | ප්‍රවාහන කටයුතු |
| | | E. | ඇතුන් ඇල්ලීම |

(1) DECA (2) DEAB (3) DEBC (4) DEAC

(35) ක්‍රි.ව. 1453 දී තුර්කිවරු විසින් අල්ලාගත් යුරෝපයේ ප්‍රධාන වෙළෙඳ නගරයක් වූයේ,

(1) වැනීසිය (2) කොන්ස්තන්තිනෝපලය

(3) ජෙනෝවා (4) එංගලන්තය



papers.lk

(36) නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස හැඳින්වෙන්නේ,

(1) ජොහැන්නස් කෙප්ලර් (2) ගැලිලියෝ ගැලිලි

(3) නිකලස් කොපර්නිකස් (4) අයිසෙක් නිව්ටන්

(37) වර්ෂ 1498 දී පෘතුගීසි ජාතික වස්කොද ගාමා පැමිණි ඉන්දියාවේ නගරය වන්නේ,

(1) කැලිකට් (2) මදුරාසිය (3) ගෝව (4) පොන්ඩිචේරි

(38) උඩරට රාජධානිය සමග පෘතුගීසීන් සිදු කළ සටනක් නොවන්නේ,

(1) දන්තුරේ (2) මුල්ලේරියාව (3) බලන (4) රන්දෙණිවල

(39) සිව්පා සතුන් නොමැරිය යුතු බවට මුල් වරට නීතියක් පනවන ලද්දේ,

(1) සතරවන මිහිඳු රජතුමා (2) සතරවන උදය රජු

(3) අමණ්ඩ ගාමිණී අභය රජු (4) පස්වන කාශ්‍යප රජු

(40) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාව පිළිබඳ තොරතුරු අනාවරණය වී ඇති ස්ථානයක් වන්නේ,

(1) බටදොඹලෙන (2) බෙල්ලන්බැඩිපැලැස්ස

(3) පාහියන්ගල (4) උඩරංචාමඩම

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

## 10 - ශ්‍රේණිය

## ඉතිහාසය - II

නම/විභාග අංකය :- ...................................................................... කාලය: පැය 03 යි.

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

### I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සිතියමට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සිතියමට සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ජම්බුකෝලපට්ටන, මාතොට, ගෝකණ්ණතිත්ථ, මැණික් ගඟ, බටදෙම්බලුන, පරාක්‍රම සමුද්‍රය, කෝට්ටේ, මහාවාලුකාගාම, සඳම්බ හළ, පුනරින්, ගොඩවාය, ගම්පොල (ලකුණු 12)

(ii) භාරුකච්ඡ, බටාවිය, රතු මුහුද, රෝමය, මහා බ්‍රිතාන්‍යය, ගෝව (ලකුණු 08)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A - වසර හතලිස් හතරක් රජරට පාලනය කළ දකුණු ඉන්දීය ආක්‍රමණිකයා
B - උඩරට රාජධානියේ අවසාන සිංහල රජතුමා
C - දුටුගැමුණු රජතුමාට විශාල ශක්තියක් වූ මව්තුමිය
D - වර්ෂ 1602 දී උඩරටට පැමිණි ලන්දේසි දූතයා (ලකුණු 04)

(ii) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.


A රූපය

(1) මෙම රූපයෙන් දැක්වෙන ගල් ගුහාව කුමක් ද?
(2) ඉහත ගල් ගුහාව පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?
(3) මෙහි ජීවත් වී ඇත්තේ කවර යුගයකට අයත් මිනිසුන් ද?
(4) පුරාවිද්‍යාත්මක කැණීම් වලින් තහවුරු වී ඇත්තේ මීට අවුරුදු කොපමණ කාලයකට ඉහත දී මෙහි මිනිසුන් වාසය කළ බව ද? (ලකුණු 04)


B රූපය

(iii) (1) මෙම රූපයෙන් නිරූපිත රජු කවරෙකු ද?
(2) මෙම ප්‍රතිමාව දක්නට ඇත්තේ කිනම් ස්ථානයක ද?
(3) මෙම රජතුමා අයත් වන යුගය කුමක් ද?
(4) මෙතුමාගේ කාලයේ විදුරු පබළු ගෙන් වූ රට කුමක් ද? (ලකුණු 04)

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැකබලා ඒ පිළිබඳ වාර්තා තබා ඇති පහත සඳහන් රටවලට අයත් සංචාරකයන් පිළිවෙලින් නම් කරන්න.

A - අරාබිය   B - චීනය   C - පෘතුගාලය (ලකුණු 03)

(ii) ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත් වී ඇති ප්‍රධාන පරිසර කලාප හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසෙන් පසු මෙරට ලියවී ඇති ශිලාලේඛනවල වාර්තා කර ඇත්තේ කිනම් ආකාරයේ කරුණු ද යන්න නිදසුන් තුනකින් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ඉතිහාසය ඉගෙන ගැනීම තුළින් තම පෞරුෂත්වය වර්ධනය වීමට බලපාන කරුණු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සඳහන් ඓතිහාසික ස්තූප ඉදි කර වීමට අනුග්‍රහය දැක් වූ රජවරුන් පිළිවෙලින් නම් කරන්න.

A - ථූපාරාමය

B - ජේතවන දාගැබ

C - අභයගිරිය (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ

A - පහත රට තෙත් කලාපීය ලෙන් දෙකක් ද,

B - සඳුකර එළිමහන් ද්‍රවයම් වාසස්ථාන දෙකක් ද, සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දුටුගැමුණු රජතුමාගේ ආගමික හා දේශපාලනික සේවාවන් නිදසුන් තුනක් ඇසුරින් ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

(iv) අතීතයේ අප රට පාලනය කළ බුද්ධිමත් රජවරු තම අසල්වැසි රටවල් සමග සුහදශීලී සබඳතා පැවැත් වූ බවට උදාහරණ තුනක් ඔස්සේ කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

(04) (i) ක්‍රිස්තු වර්ෂයෙන් එකොළොස්වන සියවසේ සිට දහතුන්වන සියවස දක්වා මෙරට ක්‍රියාත්මක වූ දකුණු ඉන්දියානු සම්භවයක් ඇති වෙළෙඳ සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් A, B, C හා D ට ගැළපෙන සෙල්ලිපිය වරහන තුළින් තෝරා පිළිවෙලින් සඳහන් කරන්න.
(වෙංතරගෙම , මණ්ඩගල, සිතුල්පව්ව, මුතුගල්ල, ගොඩවාය, වේගිරිය)

A - යකඩ කර්මාන්තය   B - ඇත්දත් කැටයම් කර්මාන්තය

C - රෙදි කර්මාන්තය   D - රන් කර්මාන්තය (ලකුණු 04)

(iii) වැවක ප්‍රධාන අංග තුනක් නම් කර ඉන් එකකින් සිදුවන කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) දඹදෙණි යුගයේ සිටි ශ්‍රේෂ්ඨ රාජ්‍ය පාලකයෙකු වූ දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන හා සාහිත්‍යය සේවා උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) දෙවන නාගරීකරණ සමයේ ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ සබඳතා පැවැත් වූ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පැරණි නගර පරිහානියට පත්වීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු බිහි වූ රාජධානිවල ආර්ථිකයේ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

(iv) මෙරට සිංහල සාහිත්‍යයේ උන්නතියට කෝට්ටේ රාජධානි සමයේ දී සිදුවූ මෙහෙවර කරුණු තුනක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

papers.lk

(06) (i) මහනුවර රාජධානියේ ඉඩම් අයිතිය හා භුක්තිය පදනම් කරගත් පහත A, B හා C යෙදුම්වලට අදාළ කෙටි යෙදුම පිළිවෙළින් නම් කරන්න.

A - විහාරාරාම සඳහා පූජා කළ ඉඩම්

B - රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම්

C - රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් (ලකුණු 03)

(ii) A, B, C හා D යන ප්‍රකාශවලට අදාළ පිළිතුර වරහන තුළින් තෝරා පිළිවෙළින් සඳහන් කරන්න.

(සුනේත්‍රා දේවී, හෙල්මළු ක්‍රමය, ශ්‍රී විජය රාජසිංහ, දියවඩන නිලමේ, කුසුමාසන දේවිය, ගජනායක නිලමේ, ශ්‍රී වික්‍රම රාජසිංහ, ලියදි ක්‍රමය)

A - උඩරට රාජධානියට පත් වූ ප්‍රථම නායක්කර් රජතුමා

B - රජවරුන් දෙදෙනෙකුට බිසව වූ උඩරට රාජ්‍යයේ උරුමක්කාරිය

C - කඳුකර ප්‍රදේශවල වී වගාවේ ක්‍රමවේදය

D - උඩරට රාජ මාලිගාවේ ඇතුළතේ කටයුතු භාර නිලධාරියා (ලකුණු 04)

(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මෙරට බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීම සඳහා අනුගමනය කළ පියවර තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානි සමය තුළ ග්‍රාමීය සමාජයේ පැවති ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) වර්ෂ 1505 දී පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට පැවති රාජධානි තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පෘතුගීසීන් ආසියාවට පැමිණීමට තුඩුදුන් ප්‍රධාන අරමුණු දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) සීතාවක රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් ලන්දේසි ප්‍රතිපත්තිවල කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) පුනරුද සමයේ කතෝලික සභාව විවේචනය කළ විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් නව නිර්මාණ බිහි කිරීමට දායක වූ පුද්ගලයින් වරහන තුළින් තෝරා ලියන්න.

(පැරසෙල්ස්, ගැලීලියෝ ගැලිලි, මයිකල් සර්වෙටස්, විලියම් හාවේ, ජොහාන්නස් ගුටන්බර්ග්, ජොහැන්නස් කෙප්ලර්)

A - දුරදක්නය B - මුද්‍රණ යන්ත්‍රය

C - රුධිර සංසරණ පද්ධතියේ වැදගත් තොරතුරු D - නූතන ඖෂධ විද්‍යාව (ලකුණු 04)

(iii) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පුනරුද සමයේ විසූ විශිෂ්ට කලාකරුවන් වූ

A - ලියනාඩෝ ඩාවින්චි B - මයිකල් ඇන්ජලෝ පිළිබඳ අගයන්න. (ලකුණු 06)

(09) (i) පහත සඳහන් රටවල් සොයා ගත් දේශගවේෂකයින් පිළිවෙළින් නම් කරන්න.

A - බටහිර ඉන්දියා දූපත්

B - පිලිපීනය

C - කැනඩාව (ලකුණු 03)

(ii) පුනරුද සමයෙන් පසුව යුරෝපයේ වෙළඳ කටයුතුවල ප්‍රමුඛත්වය ඉසිලූ රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පුනරුදයත් සමඟ යුරෝපයේ ආර්ථික කටයුතුවල ඇති වූ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

(iv) දේශගවේෂණ කටයුතුවල යෙදීමේ දී යුරෝපීයන්ට එම කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වූ හේතු තුනක් සඳහන් කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)



papers.lk

(01) (අ) (i) ප්‍රශ්නය සඳහා




papers.lk

(01) (අ) (ii) ප්‍රශ්නය සඳහා



papers.lk